සන්නස දෙවෙනි කලාපය එළි දක්වූ දවසේ ඉඳලා ලොකු කලාපයට මොනව හරි ලියන්න ඕනේ කියන සිතුවිල්ල මගේ හිතේ හරියට වද දෙමින් තිබුනේ. මේ ගැන මම ගෙදරදී ජයේ, මගේ සැමියාත් එක්ක කතා කළාම එයා කිව්වේ ලියන්න ඒත් මෙගේ අයට ගැලපෙන කියවන්න පුළුවන් විදිහට කියලා. ලංකාවෙන් මෙගෙම සංකල්පමය උනාට පස්සේ ලබපු අත්දැකීම් බොහෝ දේ වාගේ තෙරපිලා ගැලිලෙලා තිබුණත්, ඒවගෙන් නිදහස් වෙන්න හැකිවෙලා තිබුනේ නැහැ මෙතෙක්. මේක ඒ අවස්ථාවලද?

ලිව්ව සම්බන්ධයෙන් අපි අතර දිගු කතාවක් ඇති උනා. ලියන්නේ කොහොමද, මොනවද කියලා. ඩොලියෙග වයස වගේ නොවී දිරාවා ගන්න අමාරු සම්මාවර්තය රචනාවකුත් නොවී ලියන එක විය යුතු දෙයක් උනත්, ඒක මොන වගේ හැඩයක් ගත යුතුද කියලා නිශ්චිත තීරණයක් මගේත් හිතුණේ නැහැ. රචනාවක්ද තීරු ලිපියක්ද ලියන්නේ මං මගෙන්ම විමසමින් මේ ලියන්නේ. කොහෙදා හරි මං මේ මෙල්බන් සමාජය දකින විදිය සහ විඳපු විදිහ මෙහි අන්තර්ගතය වෙවී. ඒක කොහිම ලෙවලකවත් සමාජයේ සමිතත පොදු මතය නම් වෙන එකක් නැහැ.

ඇත්තටම මට ලියන්න ආසන්නම නිමිත්ත උනේ මේ සැරේ අළුත් අවුරුදු උත්සවයේදී දුටුව සිදුවීමක් අපි දන්න විදිහට අපට අහල පුරුදු පිය පුතු ගැටුම විතරයි. අදහස් පරතරයක්, පරම්පරා ගැටුම් එකිනෙකා අභිභවා යද්දී ඇති වන සංසිද්ධීන්. ගැටීම් සමාජ විකාශනයේදී අනිවාර්ය පදයක්. ඇත්තෙන්ම ඒක හුදෙක් පිය පුතු ගැටුමක් පමණක් වුනු කරලා තියෙන එක අසාධාරණයි. අපිට කවදාවත් හුරු පුරුදු? මේ දියණි ගැටුම කියලා අදහසක් ගැන. නැහැ නේද? ගැටුම් තිබුණත් කවදාවත් අර විදිහට සමාජ ගත වෙලා තියෙනවද?

ඇත්තටම එතන තියෙන්නේ අපිට හුනුරු කමක් විතරයි. සමහර විට මේ දියණි අදහස් පරතරය පිය පුතුවලට වඩා දරුනුයි. ඒත් එයා අපිට ආගන්තුක නිසා අපි බිලිගන්න මැලි වෙනවා.

අවුවා විකා ගොඩක් ලියදානා. මේක සාමාන්‍ය සිදුවීමක්. ඒත් ඒ තුළ මට හමු නැහැනේ හැමදෙනාම ප්‍රකින්න පැත්ත නෙවෙයි. ඒක උනේ මෙහෙයිලු. අවුරුදු උත්සවයදා අපි සේරම ඒ ප්‍රීතිය අත් විඳිමින් පිටිවැනිය පුරා විසිරී සිටින ජනතාව අතරේ සිටියේ. මේ අතර හිටපු වයස අවුරුදු 16 - 17 විතර තරුණ ගැහැණු ළමයි දෙදෙනෙක් ගැන මගේ අවධානය යොමු වෙලා තිබුණේ. ඒ වයසෙම පිරිමි ළමයි කීප දෙනෙක් සමගත් මවුන් කරාබන්ධ කරනවත් මම දක්නා. ඒ අතර හිටපු එක පිරිමි ළමයෙක් සමග ඇගේ විශේෂ ඇඟලුම් කමක් තියෙන බව නම් මට වැටහිලා තිබුනේ

ඒ වෙන කොට ඊට වික වෙලාවකට පස්සේ මව දක්නා අපේ වයසේ ගැහැණු කෙනෙක් අර ළමයි දෙන්නා ළඟට ඇවිත් බොහොම සද්දෙන් තර්කනාත්මකව "යමං අද ගෙදර" කියලා කෑ ගහලා නොතාවත්වාම බැන ගෙන ගියා. සිදුවෙන් මොකක්ද කියලා වවේ හිටපු කාවවත් තේරුණේ නැහැ. ඒත් මං මුළු ඉඳලම අවධානයෙන් හිටපු නිසා දක්නා ඇත්තටම ඒ වගේ කැකෑකදී නොසිදුවිය යුතු ආකාරයෙන් එය උනා. අර ගැඳුණු ළමයගේ අම්ම වෙන්න ඇති ඒ. ඇයත් තරුණයි.

ඇත්තටම මට තාමත් මතකයි ඒ තරුණ ළමයගේ ඇස් දෙක. එයා පත් වෙලා හිටපු අසරණ තත්වය. අර අම්ම කොපමණ කෑගැහුවත් ඇය සෙලවුනේ වත් නැහැ. ටික වෙලාවකින් ඇය තමන්ගේ යෙහෙලියත් දාලා සෙමෙන් සෙමින් බිම බලාගෙන පිටිවනිය කොනකට ගියා. අර අම්මා යාළුවටත් මොන මොනවදෝ කියලා යන්න ගියා තව පැත්තකට. අනේ අර යාළුවත් ටික වෙලාවකින් බිම බලාගෙන තව පැත්තකට ගියා.

ඒක සිදු වුනේ බොහොම කෙටි කාලයකදී. සුළු වෙලාවකින් සියල්ල අතීතයට එක්වෙලා ගියා. ඒත් ඒ සිද්දිය මගේ හිතේ හරියට හොල්මන් කළා. සමහර විට ඒක දකපු කීප දෙනාටත් එහෙම වෙන්න ඇති. මම ගෙදර ඇවිත් ජයයත් එක්කත් මේ ගැන කතා කළා. එයා හමු වීම දකින්නේ පොදු ඇඟැකින්. එයාට ඒක සුව දෙයක්. ඇත්ත මවත් දියණියට තරවටු කරන එක සාමාන්‍ය දෙයක්. ඒත් අපි ඉන්නේ මිස්ලෙදියාවේ අකමැත්තෙන් හරි බරවිලා සංස්කෘතිය තුළට ගොනුවෙමින්. මේක තුළ අපේ ළමයි හැමෝම මගේ නිදහස ඉක්මනි විඳිනවා අපේ රටට වඩා. අපි බොහොම සංස්කෘතික බැම්වලින් නිදහස්. ගැඳුණු පිරිමි කරා කරන එක සාමාන්‍ය දෙයක්. ඒත් එහෙම හමු ඇයි අර අම්මා තමන්ගේ ගැඳුණු දරුවට දෙනෙන් ඇඳගන ඉදිරියේ ලැජ්ජා කෙරුවේ. දරුවට ආදරය එකත් ඇත්ත. ප්‍රවේසම් කරන්න ඕනේ එකත් ඇත්ත. ඒත් සමහර විට ඇය කරා කරමින් හිටිය ළමයා ඇගේ ප්‍රේමවෙත්තය දෙන්නත් ඇති. ඒත් අර තරම් ජනකායක් මැදේදේ අර විදිහට හැසිරෙන්න. ආදරය තිබුණේ නැද්ද ගිහින් කරන දෙයක් කරන්න. අවවාද කරන්න. දඬුවම් කරන්න.

ඇත්තටම මෙ නම් ඒ දිනා බලන කෝණය ටිකක් වෙනස්. තව කාරණයක් පසුව ආරංචි වුනා. අර කාන්තාව ළමයගේ මවත් විවාහ වෙලා තියෙන්නේ ප්‍රේම සම්බන්ධයකින් කියලා. ඇත්තටම අපි හැමෝටම වගේ අපේ රටේ ප්‍රේම කිරීමේ අත්දැකීම් තියෙනවා. ලංකාවේ ප්‍රේම කිරීම මෙහේ තරම් සිල්ලර නැහැ. ඊළඟට මොන තරම් දුෂ්කරතාවයක් තියෙනවද? පාරට බැස්සත්, බස් නැවතුම්කඳී, මුහුදු වෙරළකදී, මල් වත්තකදී හමුවුනත් ආපහු ගෙවල් බලා යන්නනේ ඇස් කීකනින් බෙදිලා මොන තරම් පපා බෑයේද? අසල් වැසියන්, ඥාති හිතමිතුයන්ගේ අවධානයට හොරා කරපු මේ අසීරු ප්‍රේමයේ අත්දැකීම් තිබෙන අපි අපේ දරු පරම්පරාව මේ රටේදී ඒවගේ නිදහස ඉතා පහසු මිලට ගෙන අත්විඳිම අපි දකින්නේ එක්තා විදිහක බයකින්, සැකයකින් වේදනාවකින් හා හොඳන්නා මතු නොවෙනා පොඩි ඉරිසියාවක් එක්ක කියලයි මට හිතෙන්නේ.

හැංගි හැංගි ගුටි කකා අත්දකපු ප්‍රේමය අපේ අළුත් ඉදිරිපිට අපේ දරුවෝ ඒ සියලු බාධාවලින් තොරව විඳින කොට එක්ක සමාජ ක්‍රමයේ හැටි කියලා අපිට අපේ හිත හදාගන්න පුළුවන්ද? එතනදී ඇති වන හැඟීම ගැන මට නම් පොඩි සැකයක් තියෙනවා. ඒකට ඉරිසියාව කියන වචනය සැර වැඩිද මන්ද? මොකද කරන්නේ එක එහෙම නම් ඇත්තටම අපි මුහුණ දෙන මේ ගැටළුකාරී තත්ත්වයට පිළියම් හොයන එක ඒ තරම්ම අමාරු නැහැ. කෝපය හා දඩි බව මේවට පිළියම් නොවෙයි. හොඳම දේ නම් අපි අපේ අතීතය හා මේ වර්තමානය අතර පරතරය හා ගොඩක් පුළුවන් තරම් හොඳින් වටහා ගන්න උත්සාහ දරන එකයි. ජීවිතේ අවකටත් වැඩි කාලයක් ආසියාතික සංස්කෘතියක් තුළ හැදී වැඩුන අපිට මේ තත්ත්වයන්ට මුහුණ දෙන එක අමාරු තමයි. ඒත් මොකද කරන්නේ. ළමයි කියන්නේ අපේ ජීවිත විඳිනවනේ අපි හුරු වෙලා තියෙන්නේ. මූලිකව අපි තේරුම් ගත යුතු දේ තමයි මේ පරිසරය, වටපිටාව හා සංස්කෘතිය. ඒව තේරුම් ගන්න අපහසු නම්, අකමැති නම්, ඒවට මුසු වෙන්න කැමති නැත්නම් අපි අපේ දරුවන්ව තේරුම් ගන්න උත්සාහ ගමු.

ළමයින්ගේ ළමා කාලය අවසන් කරලා ගැටවර කාලය කියන්නේ ජීවිතයේ වර්ධනාත්මක යුගයකට එළඹෙනවා කියන එක. මේ කාලයේදී තමයි ළමයි ස්වයංමය වගකීමෙන් යුතුව තමන්ගේ ජීවිත දිගා බලන්න පටන් ගන්න කාලේ. තමන්ගේ ජීවිතයට වගකියන්න ඉන්නේ තමන් විතරයි කියන හිතන කාලේ මේ. මේ යුගයේදී තමන්ට ඕනේ දෙයක් කරන්න පුළුවන් කියලා වඩාත්ම තදින් හිතට දෙනෙන්න පටන් ගන්නවා. අපිටත් ඒ කාලේ දෙනෙමෙන්. ඉතින් ඒක මේ සමාජ ක්‍රමය තුළ වඩාත් තීව්‍ර වෙනවා. තමන්ට හිතුන දේ කරන්න පෙළඹෙනවා. අපි ඒක තේරුම් ගත යුතුයි. අපේ අත්දැකීම් අනුව ඉස්සර දරුවෝ බොහෝවිට අම්මලා කියන දේ අනවරා. ඒ අය කියන විදිහට හැසිරෙනවා ක්‍රියාකරනවා. ඒත් මෙහෙදේ මේ වගෙදේ දරුවෝ ස්වාධීනයි. ඒ ස්වාධීනත්වයට මේ සමාජ ක්‍රමය තුළ, අධ්‍යාපන රටාව තුළම ඉඩක් තියෙනවා.

අපි අපේ දරුවන්ට හංගපු දේවල් මෙහේ විවෘතයි. ලිංගික අධ්‍යාපනය ගැන, ප්‍රජනනය ගැන, පවුල් සම්බන්ධතාවයන් ගැන ළමයි ඉගෙන ගන්නේ පාසලේදී. බොහොම පසල ඉන්නේ ඉතිං. ළමයි ගැටවර වියේදී අපේ කාලේ අපි හිරියට වඩා හුඟක් ඉදිරියෙන් ඉන්නේ. මේ වයසේදී ළමයි හැමදෙනාම හැමදේම අම්මලාගෙන් අහන්නේ නැහැ. එවිට අත්වාර්යයන්ගේ, දෙමව්පියන්ගේ තිබුණු බලධාරීත්වය අනාගත ක්‍රම ක්‍රමයෙන් අඩුවෙනවා. ඒත් ඉතිං අපි කැමතිත් නැහැ ඒක අඩු කරගන්න. එතන තමයි ගැටවර පටන් ගන්නේ. අර මං දුක්ක සිද්ධිය වගේ ගෙවල්වල දරුවෝ අතර ගැටුම් ඇතිවෙන්න. ඇත්තටම මේක හරි සංවේදී ප්‍රශ්නයක්. මේකෙදී වැඩි වගකීම් තියෙන්නේ අපිට. මේ වගකීම ඉෂ්ට කරන්නේ කොහොමද කියලා තේරුම් ගන්න එක තමයි දුෂ්කර. අපි දකින දරුවෝ හැමෝම එක වගේ නැහැ. ඒ නිසා මේවා විඳලා ගැනීමට පොඩු ඉතුරුක් ඇතියි කියලා මට නම් හිතෙන්නේ නැහැ. ඉදබීම පොඩු ගුනාංගක් උනාට ගෙදාර් වෙලාවට ඒක විසඳුම්ක් වෙන්නේ නැහැ. ළමයි විවිධයි. ඒ අනුව ප්‍රශ්න විවිධයි. ඉතින් මේ විවිධ හැඩ ගන්න ප්‍රශ්නවලට පිළියමුත් විවිධයි. ඒ නිසා ගතානුගතික විදිහට හිතන්න එපා. අනුන්ගේ ක්‍රමයට ප්‍රශ්න විසඳන්න යන්න එපා. අමාරු උනත් නිවැරදි දේ. ගැලපෙන දේ කරන්න උත්සාහ ගන්න.

ඔබේ දරුවාව නිවැරදිව තේරුම් ගන්න උත්සාහ කරන්න. ප්‍රශ්න විසඳීමට උපයෝගී කරගන්නා ක්‍රමවේදයන් වටපිටාවේ අපහාසයට උපහාසයට ලක් නොවන අයුරින් කරන්න. නැතහොත් එහි ප්‍රතිඵලය පෙරලා පැමිණෙන්නේ ඔබ වෙතටමයි.

ධරණී

---

7 වන පිළෙන්

ශ්‍රාවකයන්ට දිනා ගැනීමේ මා හැඟි අත්වැලක් බව ඔහුගේ විශ්වාසයයි. ලුහුඩින් තැටිවල අඩංගු කාරණා, ගීතයේ අදහස පෙරටුකොට දක්වමින් නිෂ්පාදකයින් විසින් තැටි ප්‍රචාරය කර හැරියා, පතක සඳහන් ඕඩියන් වෙළෙඳ දැන්වීමේ දක්නට ලැබෙන්නේ ගායන ශිල්පියාගේ නම, ගීතයේ මුල් වචන සහ ගීතයේ අදහසයි.

කේ රොබට් පෙරේරා 'නිකම්ම කාලේ යන්නා'
(සමාජ ප්‍රහුන් ජාතිය නොසැලකිම)
ඩබ්.සිල්වෙස්ටර් 'ආචාරිය හක්තිය'
(ගුරු අවවාදයට පිටු පාන්නෝ)
රොමිලස් ද සිල්වා 'සාප කරති ලක මහ දන'
(ජාති හුම්ටයින් ගැන විස්තර)
'පැවතීමේ ගුණධර්ම'
(යහපත් හැසිරීමේ ප්‍රතිඵල)
එච්. ජෝන්සල් 'පොඩි කාලේ දරුවන්'
(මෙමවිසියන්ට අවවාදය)
'ලොව නසනා කැත රාගේ'
(කාමසාවන්ගේ විපාක)
'දෙනෑ මෝඩ පොළ ගැලිලා'
(මෝහන්ධකාරයේ පැටලීමේ විපාක)
දොන් බෙනඩික්ට් 'සසර සැමේ'
(සංසාර සැපත් අනිත්‍යවීර බව)

පහත දක්වෙන්නේ පර්ලඟෝන් වෙළඳ දැන්වීමක් මඟින් ශ්‍රාවක අවධානය ගීතයෙහි අදහසට ඉලක්ක කෙරෙන ආකාරයයි

ලක්ෂ්මී බායි 'ලෞකික සැප සම්පත්'
(මහත්මා ගාන්ධි ගැන)
'ශ්‍රී ලංකා මාතාගේ' (සේනානායක මහතා ගැන)
'සිතේ සෝක' (සංගීත රසය සම්බන්ධ)
'පා දරු ප්‍රේමේ'
(ගුණවත් දරුවන්ගෙන් ඇති සැපත හා අගුණවත් දරුවන්ගෙන් ඇති වන විපාක)

ගීතයෙහි විෂය කරුණු ඉස්මතු කොට දක්වන බ්‍රෝඩ්කාස්ට් වෙළෙඳ දැන්වීමක් පහත දක්වෙයි.

ලක්ෂ්මී බායි 'වන වාසේ'
(ලියන්නේ කොණ්ඩා කැපීම ගැන)
'සිතේ සෝක'
(සංගීත බලෙන් සෝක දුර ලෑම් ගැන)
ලොරන්ස් 'සිරිකත සේමා'
(ප්‍රේමය වර්ණනා කිරීම)
'බොහෝ තාන්තිමත් වේ'
(බෙබද්දන්ගේ මත පැන් වර්ණනාව)
ක්ලෙමන්ට් රැලිගෝ 'ලංකා වැසිය'
(සිංහලයන් උත්සාහය නොමැති නිසා දියුණු නොවීම ගැන)
'ප්‍රභූ ජනයා දිවේ'
(ප්‍රභූ ජනයාගේ කතාවේ සහ ක්‍රියාවේ වෙනස පෙන්වීම)
රොමිලස් ද සිල්වා සහ දොන් බෙන්ඩික්ට් 'දිනක සරිවේ'
(ශරීරයේ අවයවයන්ගේ දබරය නිසා ශරීරය ඔත්පල වීම ගැන)

'දීපෙ මෙ ලංකා'
(සිංහලයන්ගේ විකාර සිරිත් ගැන)
රොමිලස් ද සිල්වා 'මිල වෙන්නා'
(ස්ත්‍රී රූපය නිසා පුරුෂයින්ගේ ඉඳුරන් පිනවීම)

මහාචාර්ය සුනිල් ආරියරත්න